මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary: 081-2213096 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082 |

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No.: CPC/PSC/15/TO/SP-2018 | ඔබේ අංකය / உமது இல / Your No.: | දිනය / திகதி / Date: 2021-02-24 |

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්,

<u>ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I පන්තියේ/ ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u>

2015 වර්ෂයේ මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු නොතිබීම මත එම වර්ෂයට අදාළව විශේෂ ශ්‍රේණියේ පුරප්පාඩු නොමැති සේ සළකා කටයුතු කිරීම සඳහා ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GCP/13/04/01 හා 2020.12.17 දිනැති ලිපිය මගින් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව කාරුණිකව දන්වමි.

02. ඒ අනුව, මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියේ 2016 හා 2017 වර්ෂ වල පවතින පුරප්පාඩු සඳහා විශේෂ ශ්‍රේණියට උසස් කිරීම් සිදු කිරීමට මෙම කොමිෂන් සභාව තීරණය කරන ලද අතර, ඒ සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලද නිලධාරීන්ගේ සුදුසුකම් පරීක්ෂා කිරීමට අදාළව සම්මුඛ පරීක්ෂණය 2021.02.19 දිනැතිව මෙම කොමිෂන් සභාවේදී පවත්වන ලදි.

03. 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමේ සීමිත තරග විභාගය සඳහා අංක 2,141 හා 2019.09.12 දිනැති ගැසට් නිවේදනය මගින් අයදුම්පත් කැඳවන ලද නමුත් මෙතෙක් එම විභාගයේ ප්‍රතිඵල නිකුත් කර නොමැත. තවද, ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් 2019 හා 2020 වර්ෂ සඳහා විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට සීමිත තරග විභාගය සඳහා අයදුම් කිරීම සම්බන්ධයෙන් මෙතෙක් ගැසට් නිවේදන පළ කර නොමැති බවට නිරීක්ෂණය කරමි .

ඒ අනුව, මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණිය සඳහා 2018 වර්ෂයේ පවතින පුරප්පාඩු සඳහා ව්‍යවස්ථාව අනුව සේවා පළපුරුද්ද හා කුසලතාවය පදනම මත 60% ප්‍රතිශතය පමණක් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අදාළව අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් මෙම කොමිෂන් සභාවේ අවධානය යොමු වී ඇති අතර, ඒ සඳහා 2021.03.25 දිනට පෙර අයැදුම්පත් ඉදිරිපත් කරන ලෙස දන්වමින් මාගේ සමාංක හා 2021.02.24 දිනැති ලිපිය මගින් අයැදුම්පත් කැඳවන ලදි.

04. එබැවින්, 2018 වර්ෂයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවෙන් සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත 60% ප්‍රතිශතය සඳහා පමණක් මෙම අවස්ථාවේදී උසස් වීම් ලබා දිය හැකි අතර, 2018 වර්ෂයට අදාළව සීමිත තරග විභාගයේ ප්‍රතිඵල නිකුත් වූ පසුව ඒ සඳහා මුළු පුරප්පාඩු සංඛ්‍යාවෙන් වෙන් කරන ලද 40% ප්‍රතිශතය බඳවා ගත හැකිය. එසේ සීමිත පදනම මත බඳවා ගැනීමට වෙන් කරන ලද පුරප්පාඩු සංඛ්‍යාවෙන් කොපමණ ප්‍රමාණයක් 2018 වර්ෂය සඳහා සත්‍ය වශයෙන්ම බඳවා ගන්නේද යන්න තීරණය වන්නේ විභාගය සමත් වන නිලධාරී සංඛ්‍යාව අනුව වේ. එබැවින් එම සංඛ්‍යාව මෙම අවස්ථාවේදී නිශ්චිත නොවන හෙයින් හා 2018 වර්ෂයේ පවතින පුරප්පාඩු සඳහා විශේෂ ශ්‍රේණියට උසස් කිරීමෙන් අනතුරුව එම නිලධාරීන් විශ්‍රාම ගන්නා දිනයද සළකා බලා ඉදිරි වර්ෂ සඳහා නිවැරදි පුරප්පාඩු සංඛ්‍යාව ගණනය කළ යුතු බැවින්, එක් වර්ෂයක පුරප්පාඩු පිරවීමෙන් පසුව පමණක් ඉදිරි වර්ෂය සඳහා ඇති වන පුරප්පාඩු ගණනය කළ හැකිවන බව සඳහන් කරමි.

අ.පිට බලන්න

05. ඒ අනුව, 2018 වර්ෂයේ පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් වීම් ලබා දීමෙන් අනතුරුව පිළිවෙලින් ඉදිරි වර්ෂ වල පුරප්පාඩු පිරවීමට කටයුතු සිදුකරන බව කාරුණිකව දන්වමි.

06. එබැවින්, මාගේ සමාංක හා 2021.02.24 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි, 2018 වර්ෂයේ පවතින පුරප්පාඩු සඳහා මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාව අනුව සේවා පළපුරුද්ද හා කුසලතාවය පදනම මත 60% ප්‍රතිශතය පමණක් විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට අදාළව අයදුම්පත් කැඳවීම සම්බන්ධයෙන් අදාළ ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

ටී.ඒ.ඩී.ඩබ්.දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

web site: www.psc.cp.gov.lk
e-mail: psc.cp.gov@gmail.com

| | | | |
|---|---|---|---|
| කාර්යාලය / காரியாலயம் / Office: 081-2213097 | ලේකම් / செயலாளர் / Secretary: 081-2213096 | සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary: 081-5631321 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 081-2213082 |

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No.: CPC/PSC/15/TO/SP-2018 | ඔබේ අංකය / உமது இல / Your No. | දිනය / திகதி / Date: 2021-02-24 |

මධ්‍යම පළාත් සභාවේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානීන්,

**2018 වර්ෂ සඳහා සේවා පළපුරුද්ද හා කුසලතා පදනම මත**
**මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

2016.04.04 දිනැතිව ගරු ආණ්ඩුකාරතුමිය විසින් අනුමත කර ඇති, 2013.06.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.3.3 වගන්තිය ප්‍රකාරව මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) I පන්තියේ/ශ්‍රේණියේ නිලධාරීන් 2018 වර්ෂය සඳහා සේවා පළපුරුද්ද හා කුසලතා (ජ්‍යෙෂ්ඨත්වය) පදනම මත මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් කිරීමට සළකා බැලීම සඳහා 2021.03.25 දිනට පෙර අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.3.1 වගන්තිය සඳහන් ප්‍රතිශතයන් පදනම් කර ගෙන මධ්‍යම පළාත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියේ 2018.12.31 දිනට පැවති පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව අනුව 2018 වර්ෂයට උසස්වීම් ලබා දීම සිදු කරනු ලැබේ.

03. 2018 වර්ෂයේ උසස්වීම් සඳහා සළකා බැලීමට අදාළ අයැදුම්කරුවන් 2018.12.31 දිනට පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

<u>සේවා පළපුරුද්ද හා කුසලතා (ජ්‍යෙෂ්ඨත්වය) පදනම මත</u>

I. අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික (MN-03) සේවා ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (6) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (6)ම උපයාගෙන තිබීම.

II. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (5) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

III. අනුමත කාර්ය සාධනය ඇගයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

IV. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වී තිබීම.
(2013.06.01 දිනය වන විට මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් සම්පූර්ණ කර ඇති නිලධරයන් III වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ)

04. උසස් කිරීමේ ක්‍රමය :-

2013.06.01 දින සිට ක්‍රියාත්මක මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි නියමිත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ගෙන් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුසුකම් පරීක්ෂාකර බලා විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට යටත්ව උසස්වීම පිරිනැමීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

05. අයැදුම්කරුවන් විසින් අයැදුම්පත්‍රයේ අනු අංක 01 සිට 12 දක්වා කරුණු සම්පූර්ණ කළ යුතු අතර දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයැදුම්කරුවන්ගේ පෞද්ගලික ලිපි ගොනුවල ඇතුළත් විනය සම්බන්ධ කරුණු, දඬුවම්/ප්‍රශංසා දෝෂ දර්ශන සහ චර්යා සටහන් නිවැරදිව පරීක්ෂා කර බලා අයැදුම්පත්‍රයේ අනු අංක 13 සිට 17 දක්වා කොටස් සම්පූර්ණ කර තම නිර්දේශ හා අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ සහිතව 2021.03.25 දිනට පෙර මෙම කොමිෂන් සභාව වෙත පහත ලිපිනයට යොමු කළ යුතුය.

ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
තැ.පෙ. 244,
කටුගස්තොට පාර,
මහනුවර

06. සේවා පළපුරුද්ද හා කුසලතා (ජ්‍යෙෂ්ඨත්වය) පදනම මත උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමේදී කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව යොදා ගනු ලබන ලකුණු දීමේ පොදු පරිපාටිය/නිර්ණායක ඉදිරියේදී වෙබ් අඩවිය මගින් ප්‍රසිද්ධියට පත් කරනු ඇත.

වෙබ් අඩවිය : www.psc.cp.gov.lk

07. මෙම උසස් කිරීම සම්බන්ධ කටයුතු සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව ක්‍රියාත්මක කරනු ලබන අතර මෙයට අදාළ කරුණු සම්බන්ධව අවසන් තීරණ ගැනීමේ බලය කොමිෂන් සභාව සතුවේ.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,

ටී.ඒ.ඩී.ඩබ්.දයානන්ද,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

**මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**2018 වර්ෂය සඳහා මධ්‍යම පළාත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්) විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

**සේවා පළපුරුද්ද හා කුසලතා (ජ්‍යෙෂ්ඨත්වය) පදනම මත**

ආදර්ශ අයදුම්පත්‍රය

01. අයදුම්කරුගේ නම (මුලකුරු සමඟ) :- ..........

I. මුලකුරු වලින් හැඳින්වෙන නම :- ..........

..........

..........

II. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :- ..........

..........

02. උපන් දිනය:-

වර්ෂය :- .......... මාසය :- .......... දිනය :- ..........

03. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. දුරකථන අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

05. සේවය කරන අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය :- ..........

..........

06. වර්තමාන සේවා ස්ථානය:- ..........

07. ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්) I පන්තියට/ශ්‍රේණියට පත්වූ දිනය:- ..........

08. විශ්‍රාම ගෙන ඇත්නම්:-

8.1. විශ්‍රාම ගත් දිනය :- ..........

8.2. සේවය කරන ලද සේවා ස්ථානය:- ..........

09. I පන්තියට පත්වූ දින සිට 2018.12.31 දින දක්වා සේවා කාලය:- ..........

10. 2018.12.31 දිනැති වාර්ෂික ඒකාබද්ධ වැටුප :- ..........

11. 2018.12.31 දිනට පූර්වාසන්න වසර 06ක කාලය තුළ උපයාගත් වැටුප් වර්ධක දිනයන් හා වාර්ෂික වැටුප් තල

| වැටුප් වර්ධක දින | වාර්ෂික වැටුප් තල (රුපියල්) |
|---|---|
| 1. .......... | 1. .......... |
| 2. .......... | 2. .......... |
| 3. .......... | 3. .......... |
| 4. .......... | 4. .......... |
| 5. .......... | 5. .......... |
| 6. .......... | 6. .......... |

12. ඉහත සියළු තොරතුරු නිරවද්‍ය හා විශ්වාසී ලෙස මා සපයා ඇති බැව් ප්‍රකාශ කොට සහතික කරමි.

..........................................................................................................................................

නිලධාරියා/ නිලධාරිණියගේ අත්සන

දිනය:- ..............................

<u>අනු අංක 13 සිට 17 දක්වා කරුණු දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය</u>

13. වැටුප් රහිත නිවාඩු / අඩ වැටුප් නිවාඩු ලබා ගෙන ඇත්නම් එම කාල වකවානු/ දින ගණන:- ........................
(මධ්‍යම පළාත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ II 'ආ' පන්තියට පත් කළ දින සිට)

14. 2018.12.31 දිනට පූර්වාසන්න වර්ෂ 06 තුළ ඔබේ කාර්ය සාධන වාර්තා වල අයහපත් සටහන් වාර්තා කර තිබේද?

..........................................................................................................................................

..........................................................................................................................................

15. 2018.12.31 දිනට පූර්වාසන්න වර්ෂ 06ක කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන තිබේද?
2012.01.01 දිනට පසුව උපයා නොගත් වැටුප් වර්ධක වේ නම් එසේ වීමට හේතු දක්වන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

16. ඉකුත් වර්ෂ 06 තුළ විනයානුකූල නීති යටතේ ඔබට විරුද්ධව ක්‍රියා කරනු ලැබ ඇද්ද? එසේ නම් වරදේ හා පනවනු ලබන දඬුවමේ ස්වභාවය සහ දඬුවම් කළ දිනය ආදියේ විස්තර සඳහන් කරන්න.

..........................................................................................................................................

..........................................................................................................................................

17. ඉහත 14 හි දැක්වෙන අයහපත් සටහන් හෝ ඉහත 15 සහ 16 හි ඡේද වල සඳහන් කරුණු වල විනයානුකූල ක්‍රියා කිරීම් ගැන ඔබට නිරීක්ෂණ කිසිවක් තිබේද?

..........................................................................................................................................

..........................................................................................................................................

**<u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය</u>**

මෙම ආකෘති පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ තොරතුරු.......................................................................................................

...............මයා/ මිය / මෙනවිය ගේ සේවා වාර්තා හා සංසන්දනය කළ බවත්, ඒවා නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

2018.12.31 දිනට මධ්‍යම පළාත් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ (සිවිල්) I පන්තියේ/ශ්‍රේණියේ අවම වශයෙන් සක්‍රිය සේවා කාලය වසර හයක් (06) සම්පූර්ණ කර ඇති බවත්, එදිනට වසර 06 ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවත්, ඉහත සඳහන් කළ සියළු කරුණු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බවත්, ඔහුට/ ඇයට විරුද්ධව යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, ඉදිරියේදී එසේ ක්‍රියා මාර්ගයක් ගැනීමට අදහස් නොකරන බවත්, 2018.12.31 දිනට පූර්වාසන්න කාලයට නියමිත වැටුප් වර්ධක 06ම උපයාගෙන ඇති බවත් සේවා ව්‍යවස්ථාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා මෙම නිලධාරියා/නිලධාරිණිය සියළු සුදුසුකම් සපුරා ඇති බවට නිර්දේශ කරමි/නොකරමි.

.......................................................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය:- ..............................

---

**<u>අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය</u>**

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය හා එකඟ වෙමි/ එකඟ නොවෙමි. අයැදුම්පත නිර්දේශ කරමි/නොකරමි.

.......................................................................................................

අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන සහ නිල මුද්‍රාව

දිනය:- ..............................